සුවෙන් පෙරට
e ඉගෙනුම් පියස
මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ZEOM
කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| වාරය - II වාරය | | |
|---|---|---|
| ශ්‍රේණිය : 11 ශ්‍රේණිය | විෂය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 18 පාඩම - මිහිලිය නළලේ අංජන තිලකේ ...... |

## පාඩමේ අන්තර්ගතය කෙටියෙන් ........................

- ✓ පුරවැසියෙකුට තම මව්බිම , ජන්ම භූමිය කෙරෙහි ඇතිවන කැපවීම හා ගෞරවාන්විත හැඟීම දේශප්‍රේමය, දේශානුරාගය, දේශාභිමානය යන නම් වලින් හඳුන්වනු ලබයි.
- ✓ විසිවන සියවසේ මුල් භාගයේ යටත් විජිත විරෝධී හැඟීම් ඉස්මතු කරමින් නිර්මාණකරණයේ නිරත වූ ලේඛකයන් ලෙස ඇස්. මහින්ද හිමි, ආනන්ද රාජකරුණා, කුමාරතුංග මුනිදාස හැඳින්විය හැකිය.
- ✓ යටත් විජිත තත්වයෙන් නිදහස් වූ පසුව දේශභිමානී හැඟීම් දනවන සාහිත්‍ය නිර්මාණ කළ ලේඛකයන් අතර අරිසෙන් අහුබුදු, මහගමසේකර ආදීහු ප්‍රමුඛ වේ.
- ✓ අරිසෙන් අහුබුදු සූරීන් හා සුනිල් ආරියරත්නයන් විසින් රචනා කරන ලද දේශභිමානී ගීත දෙකක් මෙම පාඩමට ඇතුළත් වේ.

## පාඩම ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. අරිසෙන් අහුබුදු සූරීන් විසින් තම පද්‍ය නිර්මාණයෙන් ඉස්මතු කරන්නේ කුමක් ද?
2. ''ලංකා ලංකා පෙම්බර ලංකා ....'' මෙම ගීතයෙහි ඇති විශේෂත්වය කුමක් ද?
3. මෙම ගීතයෙහි ඇති මාත්‍රා ගණන කොපමණ ද?
4. මෙම ගීතයෙහි ආකෘතිය කුමක් ද?
5. ''මිහිළිය නළලේ අංජන තිලකේ ......'' පද්‍ය පන්තියෙහි රචකයා කවුද?
6. එය ගායනා කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
7. පහත සඳහන් වචන වලට සමාන අර්ථය දෙන පද පාඩමෙන් තෝරා ලියන්න.
    i. ජීවිතය - ..............................................................................
    ii. රජවරු - ..............................................................................
    iii. උගතුන් - ..............................................................................
    iv. කවියන් - ..............................................................................

v. නිරය - ..........................................................................................

vi. මඟී කාන්තාව - ..........................................................................................

vii. බාහු බලය - ..........................................................................................

viii. නර විරුවන් - ..........................................................................................

8. මෙම පද්‍ය පන්තියෙන් කියවෙන රජවරුන් කවුරුන් ද?

9. පද්‍ය පන්තියෙන් කියවෙන උගතුන් කවුරුන් ද?

10. පද්‍ය පන්තියට අනුව කියවෙන ගංගා සතර මොනවා ද?

11. පද්‍ය පන්තියට අනුව කියවෙන කඳු පන්ති මොනවා ද?

12. පද්‍ය පන්තියෙහි සඳහන් උපමාවක් තෝරා ලියන්න.

13. මෙම පද්‍ය පන්ති දෙක කියවීමේ දී ඔබේ සිතෙහි ඇතිවන හැඟීම් විස්තර කරන්න.